මියල ම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது/ All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

අ.පො.ස.(උ.පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2025

චිත්‍ර කලාව I	51	S	I	13ශ්‍රේණිය

II කොටස

- මෙම කොටස අනු කොටස් තුනකින් සමන්විතය
- "අ" කොටසින් ප්‍රශ්න 2ක් සහ "ආ" සහ "ඉ" යන කොටස් දෙකෙන් **එක්** ප්‍රශ්නය බැගින් තෝරාගෙන ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න.
- (අවශ්‍ය තැන්හිදී සචිත්‍ර කිරීම ඔබට වාසිදායක වේ)

'අ' කොටස
(චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ශ්‍රී ලංකාව)

1. අනුරාධපුර සහ පොළොන්නරු යුගයේ ශෛලමය මූර්ති , කැටයම් කලාත්මක බවින් උසස් මට්ටමක පැවතුණි.
   i. අනුරාධපුර සහ පොළොන්නරු යුග වලට අයත් ආබද්ධ ප්‍රතිමා එක බැගින් නම් කරන්න. (ලකුණු 2)
   ii. පොළොන්නරු යුගයේ විශිෂ්ටතම සඳකඩපහණ පිළිබඳ විග්‍රහයක් කරන්න. (ලකුණු 5)
   iii. ගුප්ත යුගයේ කලා ලක්ෂණ "ඉසුරුමුණි" කැටයම් සඳහා බලපා ඇති අයුරු උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 8)

2. නරඹන්නන්ගේ සිත්තුළ බුද්ධ දර්ශනය පිළිබඳ පහන් සිතුවිලි ඇති කරලීමට බෞද්ධ සිතුවම් පිටුවහලක් වී ඇත.
   i. එම සාර්ථක සිත්තරාගේ විහාර බිත්ති සිතුවම් දැකිය හැකි විහාරස්ථාන දෙකක් නම් කරන්න. (ලකුණු 2)
   ii. "බුදුන්වහන්සේ මහියංගනයට වැඩම කිරීම" සිතුවම ඇසුරින් සෝලියස් මෙන්දිස් ගිල්පියාගේ කලා භාවිතය විස්තර කරන්න. (ලකුණු 5)
   iii. එම සාර්ථක සහ සෝමබන්දු විද්‍යාපති යන විහාර සිත්තරුන් විසින් නිර්මාණය කරන ලද, සිදුහත් යශෝධරා සරණ මංගල්‍යය සිතුවම් දෙක පිළිබඳ තුලනාත්මක විග්‍රහයක් කරන්න. (ලකුණු 8)

3. විවිධ යුගයන්හිදී හමුවන වාස්තු විද්‍යා අංග සහ ඒ හා සබැඳි කලා නිර්මාණ අනීත රජවරුන්ගේ ප්‍රෞඩත්වය ලොවට විදහා දක්වයි.
   i. අනුරාධපුර යුගයට අයත් පොකුණු දෙකක් නම් කරන්න. (ලකුණු 2)
   ii. නිශ්ශංක ලතා මණ්ඩපයේ ආකෘතික ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 5)
   iii. යාපහුව වාස්තු විද්‍යා ඉදිකිරීම් සඳහා මූර්ති, කැටයම් උපයෝගී කරගෙන ඇති ආකාරය සහ ඒ වායේ වාස්තු විද්‍යාත්මක ලක්ෂණ , පියගැටපෙළ ආශ්‍රිත නිර්මාණ ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු 8)

'ආ' කොටස
(චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ඉන්දියාව)

4. ඉන්දීය බෞද්ධ නිර්මාණ අතර "බුද්ධ ප්‍රතිමාව" විවිධ වූ වෙනස්කම් වලට ලක්වෙමින් නිම වූ උත්කෘෂ්ටවත් නිර්මාණයකි.
   i. ගාන්ධාර ශිල්පීන් අතින් නිමවූ බුද්ධ ප්‍රතිමා දෙකක් නම් කරන්න. (ලකුණු 2)
   ii. බුද්ධ ප්‍රතිමාවේ ප්‍රභවය සිදු වූ අයුරු කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 5)
   iii. ගාන්ධාර සම්ප්‍රදායේ සම්කාලීනව හා සංවර්ධනය වූ මතුරා කලා සම්ප්‍රදාය තුළ නිමි වූ බුද්ධ ප්‍රතිමා ගාන්ධාර බුදුපිළිම වලට වඩා අධ්‍යාත්මික ගුණයෙන් පරිපූර්ණය, උදාහරණ ඇසුරින් පහදන්න. (ලකුණු 8)

5. ඉන්දීය නූතන චිත්‍ර කලාව සඳහා 19 වන සියවස අග සහ විසි වන සියවසේ සමාජ දේශපාලනික වෙනස්කම් ප්‍රබල ලෙස බලපෑම් ඇති කරයි.
   i. ත්‍රිත්වාත්‍ය ශාස්ත්‍රාලීය යථාර්ථවාදය අනුගමනය කරන ලද සිතුවම් දෙකක් නම් කරන්න. (ලකුණු 2)
   ii. ඉන්දීය නව ජීවන ව්‍යාපාරයේ නිර්මාණවල පොදු ලක්ෂණ සැකෙවින් පැහැදිලි කරන්න. (ලකුණු 5)
   iii. ඉන්දීය සමාජය පිළිබඳ අවිවිතා - ෂෙර් -ගිල් ප්‍රකාශනාත්මක චිත්‍රණය කළ ආකාරය විග්‍රහ කරන්න. (ලකුණු 8)

'ඉ' කොටස
චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - (යුරෝපය)

6. පුනරුදයෙන් ආරම්භ වූ ශාස්ත්‍රාලීය චිත්‍ර කලාව පසුකාලීනව නව මං පෙත් ඔස්සේ විකාශනය විය.
   i. ඔස්ට්‍රියන් දෙවි මැදුරේ සීලිංගල් ඇන්ජලෝ විසින් නිර්මිත සිතුවම් දෙකක් නම් කරන්න. (ලකුණු 2)
   ii. "පරිනාසිස්" සිතුවමෙන් නිරූපිත පැරණි ග්‍රීක - රෝම සමභාවය කලාවේ පෝමා දෘෂ්‍ය මූලයන් බලපා ඇති ආකාරය පිළිබඳ සාකච්ඡා කරන්න. (ලකුණු 5)
   iii. "අවසන් රාත්‍රී භෝජන සංග්‍රහය සහ 'අවිශ්වෝන්ඩි ශ්‍රවතියෝ' යන සිතුවම් දෙක පිළිබඳව මෛලේය, සම්පිණ්ඩනය, මාධ්‍ය භාවිතය සහ භෑලීම් ප්‍රකාශනය ඇසුරින් සංසන්දනාත්මකව විග්‍රහයක් කරන්න. (ලකුණු 8)

7. ග්‍රීක සහ රෝම ශිල්පාචාර්ය තුළින් විශිෂ්ට නිර්මාණ රැසක් ලොවට දායාද කර ඇත.
   i ග්‍රීක සමභාවය යුගයට අයත් මූර්ති ශිල්පීන් දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 2)
   ii. ග්‍රීක වාස්තු විද්‍යා නිර්මාණයන්ට යොදාගත් තුළුණු නම්කර කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5)
   iii. ග්‍රීක මූර්ති කලාවෙන් "රෝම මූර්ති" කලාව වෙනස් වන ආකාරය උදාහරණයක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 8)

***

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi